# නර්තනය - 6 ශ්‍රේණිය

(දෙවන වාරය )




e තක්සලාව
The National e-learning Portal for the General Education

නිපුණතා මට්ටම - 6.4
ක්‍රියාකාරකම - වෙසක් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමු.


# වෛශාඛ්‍ය මංගල්‍යය

## බෞද්ධ ජනතාවට වෙසක් පොහෝ දිනය වැදගත් වන්නේ ඇයි ?


තෙමඟුල සිහිපත් කිරීම සඳහා ය



සිදුහත් කුමරු ඉපදීම



සිදුහත් බෝසතාණන්ගේ බුදු වීම




බුදුරජාණන් වහන්සේගේ පරිණිර්වානය

## වෙසක් උත්සවය සමරනු ලබන වෙනත් රටවල් ........

1. ජපානය
1) තායිලන්තය
2) බුරුමය ( මියන් මාරය )

➢ වෙසක් උත්සවය සෑම වර්ෂයකම මැයි මාසයට යෙදේ.

## වෙසක් උත්සවය හා සබැඳි කලා අංග නිර්මාණය

<u>වෙසක් උත්සවය හා සබැඳි සැරසිලි</u>

1. අලංකාර පහන් කූඩු එල්ලා ආලෝකවත් කිරීම.
2. විහාර බිම පිරිසිදු කර කොඩි වැල් වලින් සැරසීම./නගර,වීදි බෞද්ධ කොඩිවලින් සැරසීම.
3. නිවාස,වීදි,නගර වල විදුලි පහන් හා විදුලි බුබුළු වැල් ආදියෙන් ආලෝකවත් කිරීම.
4. දර්ශනීය තොරණ් නිර්මාණය කර මහ ජනතාවට ප්‍රදර්ශනය කිරීම.
5. වෙසක් කලාප හා පහන් කූඩු තරඟ පැවැත්වීම.
6. තොරණ් ප්‍රදර්ශනය කරන ස්ථානවල සල්පිල්,විරිඳු හා කවි ගායනා ආදි විශේෂ අංග පැවැත්වීම.

- දුවේ,පුතේ ඔබගේ මතකයන් සමඟින් මෙම කලා අංග දෙස කරුණාව මුල් කොටගත් මතකය අවදි කරන්න.













## වෙසක් උත්සවය හා සබැඳි නර්තන , ගායන , වාදන අවස්ථා

1. භක්ති ගීත සංදර්ශන
2. වෙසක් නාට්‍ය ( වේදිකා , රූකඩ ආදිය ලෙස )
3. මල් පෙරහැර ආදිය

## වෙසක් උත්සවය හා සබැඳි සාර ධර්ම

1) ආහාර දන්සැල් සංවිධානය කිරීම.
2) මල් දන්සැල්
3) ලේ දන්දීමේ පිංකම් , ඇස් කණ්ණාඩි බෙදා දීම.
4) ආබාධිත පුද්ගලයන් සඳහා රෝද පුටු , කිහිලි කරු වැනි උපකරණ ආදිය ලබා දීම.

✓ වෙසක් උත්සවය බෞද්ධයින්ට මෙන්ම අන්‍ය ආගමිකයන්ට ද සතුට , විනෝදය භක්තිය ඇති කරවන කාලයකි.

# කාර්‍ය පත්‍රිකාව

05

1) වෙසක් උත්සවය පැවැත්වීමේ හේතු ලියන්න.

2) වෙසක් උත්සවය හා බැඳි නර්තන , ගායන ,වාදන හා සැරසිලි අංග වෙන වෙනම ලියන්න.

3) මෙම උත්සවය තුලින් ගොඩ නැගෙන සමාජ සහජීවනය ඔබේ වචනයෙන් විස්තර කරන්න.

4) වෙසක් උත්සවය හා සබැඳි සැරසිලි අංගයක් චිත්‍රයට නගන්න.

5) වෙසක් කාඩ් පතකට ගීතයක් හෝ කවියක් නිර්මාණය කරන්න.


- **උපදේශකත්වය – එස්. එම්. ඩී. පී .සේනානායක (ස. අ .අ. නර්තන ක. අ. කා. හෝමාගම)**

**සැකසුම - එස් ආර් ආර් ඩබ්.ඩබ්. එම්.පී.කේ. වික්‍රමසූරිය**